පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 11 |

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- **බුද්ධ ධර්මය - I, II**

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ...............................

කාලය : පැය 3 යි. මිනිත්තු 10

## I පත්‍රය

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

1. සිදුහත් බෝසතාණන් වහන්සේ සියලු රජ සැප අතහැර දමා ඡන්න ඇමති සමග කන්ථක අසුපිටින් මහාභිනිෂ්ක්‍රමණය කළහ. මෙම සිදුවීම සිදුවූයේ,
   (1) ඇසළ පුන් පොහෝ දිනක ය. (2) පොසොන් පොහෝ දිනක ය.
   (3) වෙසක් පුන් පොහෝ දිනක ය. (4) දුරුතු පුර පසළොස්වක පොහෝ දිනක ය.

2. සිදුහත් බෝසතාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් අනතුරුව උන්වහන්සේගේ මුවින් පිටවූ පළමු උදාන වැකිය වන්නේ,
   (1) නිබ්බුතා නූන සා මාතා - නිබ්බුතා නූන සෝ පිතා.
   (2) අනේකජාති සංසාරං - සන්ධාවිස්සං අනිබ්බිසං.
   (3) අග්ගෝ හමස්මි ලෝකස්ස - ජෙට්ඨෝ හමස්මි ලෝකස්ස.
   (4) අක්කෝධේන ජිනේ කෝධං - අසාධුං සාධුනා ජිනේ.

3. බුදුරජාණන් වහන්සේ අංගුලිමාල දමනය කිරීම තුළින් ප්‍රකට වන බුදු ගුණය වන්නේ,
   (1) ලෝකවිදූ බුදු ගුණය යි. (2) අරහං බුදු ගුණය යි.
   (3) සුගත බුදු ගුණය යි. (4) පුරිසධම්ම සාරථී බුදු ගුණය යි.

4. නැගිට ගැනීමටවත් බැරි තරමට කෑම කා එහිම පෙරළී සිටින තැනැත්තා බුදු දහමෙහි දැක්වෙන්නේ,
   (1) භුත්තවමිතක වශයෙනි. (2) අලංසාටක වශයෙනි.
   (3) තත්ථාවට්ටක වශයෙනි. (4) කාකමාසක වශයෙනි.

5. සිතෙහි පවතින නොසන්සුන් බව, විසුරුණු ගතිය, සෙලවෙන ගතිය, කළ නොකළ වරද පිළිබඳව තැවෙන ස්වභාවය බුදු දහමෙහි සඳහන් වන්නේ,
   (1) උද්ධච්ච කුක්කුච්ච නීවරණය ලෙසය. (2) විචිකිච්ඡා නීවරණය ලෙසය.
   (3) ව්‍යාපාද නීවරණය ලෙසය. (4) ථිනමිද්ද නීවරණය ලෙසය.

6. බෞද්ධයන් වශයෙන් අප කළ යුත්තේ දැහැමි රැකියාවන්ය. අදැහැමි ධනෝපායනය අතහැර දැහැමි ධනෝපායනයෙන් ජීවත් වීමට බුදුදහම උගන්වයි. මෙම අදහසට වඩාත් හොඳින් ගැළපෙන්නේ,
   (1) සම්මා දිට්ඨිය යි. (2) සම්මා කම්මන්තය යි.
   (3) සම්මා ආජීවය යි. (4) සම්මා වායාමය යි.

7. යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතු තථාගතෝ ආහ. යන මෙම ගාථා දෙපදය උපතිස්ස පිරිවැජියාට දේශනා කරනු ලැබුවේ.
   (1) භද්දිය හිමියන් විසිනි. (2) වප්ප හිමියන් විසිනි.
   (3) කොණ්ඩඤ්ඤ හිමියන් විසිනි. (4) අස්සජි හිමියන් විසිනි.

8. සිදුහත් බෝසත් කුමරු ළමා කළ ශිල්ප උගත් බමුණු පඬිවරයාණන් වන්නේ,
   (1) සර්ව මිත්‍ර බමුණාය. (2) කාලදේවල බමුණාය.
   (3) කොණ්ඩඤ්ඤ බමුණාය. (4) චංකි බමුණාය.

9. බෞද්ධයාගේ නිත්‍ය සීලය ලෙස සැලකෙන්නේ,
   (4) පංච සීලය යි.
   (2) අෂ්ඨාංග සීලය යි.
   (3) දස සීලය යි.
   (4) නවාංග සීලය යි.

10. බුදුරජාණන් වහන්සේ දාන පරමත්ථ පාරමිතාව පිරූ අවස්ථාව දැක්වෙනුයේ,
   (1) සිවි ජාතකයෙනි.
   (2) සස ජාතකයෙනි.
   (3) වෙස්සන්තර ජාතකයෙනි.
   (4) මඛාදේව ජාතකයෙනි.

11. ඔබ දෙවියෙක් ද, ගාන්ධර්වයෙක් ද, යක්ෂයෙක් ද, මනුෂ්‍යයෙක් ද ආදි වශයෙන් බුදුරජාණන් වහන්සේගෙන් විමසනු ලැබුවේ.
   (1) දෝණ බමුණා ය.
   (2) සුප්පිය බමුණා ය.
   (3) පොට්ඨපාද බමුණා ය.
   (4) කසීබාරද්වාජ බමුණා ය.

12. සමථ භාවනාව වැඩීම සඳහා යොදාගත හැකි කර්මස්ථාන ගණන වන්නේ,
   (1) 20කි.
   (2) 30කි.
   (3) 40කි.
   (4) 50කි.

13. බුද්ධ දේශනාවට අනුව ස්කන්ධ ධර්ම පහකි. ඒවා පිළිවෙලින් ඇති වරණය තෝරන්න.
   (1) විඤ්ඤාණ, රූප, වේදනා, සංඛාර, සඤ්ඤා.
   (2) වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ, රූප.
   (3) රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ.
   (4) සංඛාර, විඤ්ඤාණ, වේදනා, රූප, සඤ්ඤා.

14. වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමිපාණන් වහන්සේ විසින් රචිත ධර්ම ශාස්ත්‍රීය ග්‍රන්ථයක් **නොවන්නේ**.
   (1) මුණිගුණාලංකාරය.
   (2) සාරාර්ථ සංග්‍රහය.
   (3) සතරබණවර සන්නය.
   (4) ධර්ම විනිශ්චය.

15. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සිගාලෝවාද සූත්‍රයට අනුව දකුණු දිශාවට උපමා කර ඇත්තේ,
   (1) ගුරුවරුන් ය.
   (2) පුත්‍රදාරාවන් ය.
   (3) හිත හිතමිතුරන් ය.
   (4) පැවිදි උතුමන් ය.

16. දෙවන ආත්මභාවයෙන් පසු කවර හෝ ආත්ම භාවයක දී විපාක දීමට ඉදිරිපත් වන කර්මය.
   (1) දිට්ඨධම්මවේදනීය කර්මය යි.
   (2) උපපජ්ජවේදනීය කර්මය යි.
   (3) අපරාපරියවේදනීය කර්මය යි.
   (4) උහෝසි කර්මය යි.

17. බුදුරජාණන් වහන්සේ දීඝජාණු කෝලීය පුත්‍රයාට දේශනා කළ මෙලොව හිතසුව පිණිස හේතුවන කරුණු අතර ධාර්මිකව උපයාගත් ධනය විනාශ වීමට ඉඩ නො දී රැකගෙන කටයුතු කිරීම.
   (1) උට්ඨාන සම්පදාව නම් වේ.
   (2) ආරක්ඛ සම්පදාව නම් වේ.
   (3) කල්‍යාණමිත්තතා නම් වේ.
   (4) සමජීවිකතා නම් වේ.

18. සත්ත්ව වර්ගයා අතර ජීව විද්‍යාත්මක වෙනස්කම් දැක්වීමට බොහෝ සාධක පැවතිය ද, මිනිසා පිළිබඳව එබඳු වෙනස්කම් දැකිය නොහැකි බව බුදුරජාණන් වහන්සේ දැක්වූයේ,
   (1) වාසෙට්ඨ සූත්‍රයේ දී ය.
   (2) අම්බලට්ඨි සූත්‍රයේ දී ය.
   (3) සිගාලෝවාද සූත්‍රයේ දී ය.
   (4) පරාභව සූත්‍රයේ දී ය.

19. චූල්ලකම්ම විභංග සූත්‍රයට අනුව ගරුකළ යුත්තන්ට ගරු නොකරන, පිදිය යුත්තන් නොපුදන, අධික මානයෙන් යුත් තැනැත්තා,
   (1) බොහෝ ආබාධ රහිතව උපදී.
   (2) බොහෝ ආබාධ සහිතව උපදී.
   (3) උසස් යැයි සම්මත කුලවල උපදී.
   (4) පහත්යැයි සම්මත කුලවල උපදී.

20. අනුලෝම පටිච්ච සමුප්පාද ධර්මයට අනුව වේදනාව හේතුකොට ගෙන තණ්හාව ඇතිවේ. ඒ බව,
   (1) තණ්හා පච්චයා උපාදානං තුළින් කියවේ.
   (2) උපාදාන පච්චයා භවෝ තුළින් කියවේ.
   (3) වේදනා පච්චයා තන්හා තුළින් කියවේ.
   (4) ඵස්ස පච්චයා වේදනා තුළින් කියවේ.

21. බුදුරජාණන් වහන්සේ, තමන් වහන්සේට බුද්ධත්වය ලබා ගැනීම සඳහා උපකාර වූ බෝධීන් වහන්සේ දෙස ඇසිපිය නොහෙලා බලාසිටියේ බුද්ධත්වයට පත් වීමෙන්,

(1) දෙවන සතියේ ය. (2) තුන්වන සතියේ ය.
(3) හතරවන සතියේ ය. (4) පළමුවන සතියේ ය.

22. කුස පුරා ආහාර අනුභව කිරීම නිසා ශාරීරික වශයෙන් අපමණ පීඩාවට පත්ව සිටි රජුට බුදුරජාණන් වහන්සේ උපදෙස් දුන්නේ පමණ දැන ආහාර අනුභව කරන ලෙසය. මෙම රජතුමා,

(1) බිම්බිසාර රජතුමා ය. (2) කොසොල් රජතුමා ය.
(3) උදේනි රජතුමා ය. (4) ධර්මාශෝක රජතුමා ය.

23. ප්‍රථම ධර්ම සංගායනාවට අනුව ඒ ඒ ධර්ම කොටස් භාණක පරම්පරාවලට බෙදන ලදි. මේ අනුව සැරියුත් තෙරුන් ඇතුළු ශිෂ්‍යානු ශිෂ්‍ය පරම්පරාවට භාරවූයේ,

(1) දීඝ නිකාය යි. (2) අංගුත්තර නිකාය යි.
(3) ඛුද්දක නිකාය යි. (4) මජ්ඣිම නිකාය යි.

24. මිහිඳු මහ රහතන් වහන්සේ ප්‍රධාන ධර්ම දූත පිරිස ශ්‍රී ලංකාවට වැඩම කරනු ලැබුවේ දෙවනපෑතිස් රජතුමාගේ,

(1) දෙවන රාජ්‍ය වර්ෂයේ දී ය. (2) තෙවන රාජ්‍ය වර්ෂයේ දී ය.
(3) පළමු රාජ්‍ය වර්ෂයේ දී ය. (4) සිව්වන රාජ්‍ය වර්ෂයේ දී ය.

25. බුද්ධ ප්‍රතිමා තුළ දකුණු අත උඩට නවා ඇඟිලි සම්පූර්ණයෙන් දිග හැර අත්ල ඉදිරියට සිටින සේ නිරූපණය කරන්නේ,

(1) ධර්ම චක්‍ර මුද්‍රාව යි. (2) විතර්ක මුද්‍රාව යි.
(3) අභය මුද්‍රාව යි. (4) ධ්‍යාන මුද්‍රාව යි.

26. නූතන චිත්‍ර කලාවෙහි ප්‍රභල නිර්මාණ කරුවෙකු විසින් බොරැල්ලේ ගෝතමී විහාරයේ චිත්‍ර ඇඳ ඇත. එම නිර්මාණ කරුවා වන්නේ,

(1) සෝලියස් මෙන්දිස් ය. (2) ජෝර්ජ් කීට් ය.
(3) ඇල්බට් ධර්මසිරි ය. (4) සෝමබන්දු විද්‍යාපති ය.

27. උත්සාහයෙන් හා දෑතේ ශක්තියෙන් දහඩිය වගුරවමින් ධාර්මික ව උපයා ගත් ධනයක් තමනට ඇතැයි සිතා යමෙක් සතුටු වෙයිද එය,

(1) භෝග සුඛය යි. (2) අත්ථි සුඛය යි.
(3) අනවජ්ජ සුඛය යි. (4) අනණ සුඛය යි.

28. මිනිසෙකු විසින් උපයන ලද දැහැමි ධනයෙන් පංච බලි නම් වූ යුතුකම් ඉටු කල යුතුය. ඒ අතර පුබ්බපේත බලි යනු,

(1) ඥාතීන්ට කලයුතු යුතුකම් ය. (2) ආගන්තුකයන්ට කලයුතු යුතුකම් ය.
(3) රජවරුන්ට කලයුතු යුතුකම් ය. (4) මියගිය ඥාතීන්ට කලයුතු යුතුකම් ය.

29. ලෞකික ධ්‍යාන උපදවාගත් පසු සිල් රැකීමෙන් හා සිත පිරිසිදු කර ගැනීමෙන් ඇතිවෙන විශේෂ ප්‍රතිලාභ නිවැරදි ව දැන ගැනීම,

(1) කම්මස්සකතා සම්මා දිට්ඨිය යි. (2) ධ්‍යාන සම්මා දිට්ඨිය යි.
(3) විදර්ශනා සම්මා දිට්ඨිය යි. (4) මාර්ග සම්මා දිට්ඨිය යි.

30. සිදුහත් කුමරු රජමාලිගයෙන් බැහැරව යද්දී සතර පෙර නිමිති දකින ලදී. ඒවා පිළිවෙලින් ඇති වරණය තෝරන්න.

(1) මහල්ලෙක්, ලෙඩෙක්, මළමිණියක්, පැවිදිරුවක්.
(2) ලෙඩෙක්, මහල්ලෙක්, මළමිණියක්, පැවිදිරුවක්.
(3) මළමිණියක්, පැවිදිරුවක්, මහල්ලෙක්, ලෙඩෙක්.
(4) මහල්ලෙක්, මළමිණියක්, ලෙඩෙක්, පැවිදිරුවක්.

31. "මාගේ මේ ව්‍යායාමය බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස මිස කිසි කලෙකත් රජ සැප පිණිස නොවන්නේය" මෙම අභීත සටන් පාඨය ප්‍රකාශ කරනු ලැබුවේ,
   (1) දේවානම්පියතිස්ස මහරජතුමා ය.
   (2) විජයබාහු රජතුමා ය.
   (3) මහා පරාක්‍රමබාහු රජතුමා ය.
   (4) දුටුගැමුණු මහ රජතුමා ය.

32. තමාට අහිත වූ අයහපත් දේ කිරීම ඉතාම පහසුය. යම් දෙයක් තමාට වැඩදායක ද යහපත පිණිස හෝ පවතී ද එවැනි දේ කිරීම ඉතා අපහසු ය. මෙම අදහස පැවසෙන ධම්ම පද ගාථාවේ මුල් දෙපදය වන්නේ,
   (1) අචරිත්වා බ්‍රහ්ම චරියං - අලද්ධා යොබ්බනේ දනං.
   (2) සුකරානි අසාදූනි - අත්තනෝ අහිතානිච.
   (3) අත්තනාව කතං පාපං - අත්තනා සංකිලිස්සති.
   (4) තංච කම්මං කතං සාදු - යං කත්වා අනුතප්පති.

33. පංචස්කන්ධ ධර්මතාවන් අතර රූපය උපමා කොට ඇත්තේ,
   (1) දිය බුබුළකට ය.
   (2) පෙණ පිඩකට ය.
   (3) මිරිඟුවකට ය.
   (4) කෙසෙල් කඳකට ය.

34. බුදුරජාණන් වහන්සේ විසින් බරණැස ඉසිපතන මිගදායෙහි දී ප්‍රථම ධර්ම දේශනාව පස්වග භික්ෂූන් වහන්සේලාට දේශනා කරන ලදී. මෙම දේශනාව වන්නේ,
   (1) සිගාලෝවාද සූත්‍රය යි.
   (2) ව්‍යග්ඝපජ්ජ සූත්‍රය යි.
   (3) දම්සක් පැවතුම් සූත්‍රය යි.
   (4) පරාභව සූත්‍රය යි.

35. බුදුරජාණන් වහන්සේ, ඇතෙකුගේ හා වඳුරෙකුගේ උවටැන් ලබමින් පාරිලෙය්‍ය වනයේ වැඩ වාසය කරනු ලැබුවේ,
   (1) පස්වන වස් කාලයේ ය.
   (2) අටවන වස් කාලයේ ය.
   (3) හයවන වස් කාලයේ ය.
   (4) දහවන වස් කාලයේ ය.

36. උස් හඬින් කතා කළොත් බුදුරජාණන් වහන්සේ තම අසපුවට වැඩම නොකරාවි යැයි ප්‍රකාශ කරමින් තම ශ්‍රාවක පිරිස නිශ්ශබ්ද කරනු ලැබුවේ,
   (1) සංජය පිරිවැජියා ය.
   (2) උපතිස්ස පිරිවැජියා ය.
   (3) පොට්ඨපාද පිරිවැජියා ය.
   (4) කෝලිත පිරිවැජියා ය.

37. පාලි ත්‍රිපිටකය ඉංග්‍රීසියට පරිවර්තනය කොට බෙදා හැරීම සඳහා එංගලන්තයේ පාලි ග්‍රන්ථ සමාගම (Pali Text Society) පිහිටුවා ගනු ලැබුවේ,
   (1) රිස් ඩේවිඩ්ස් පඬිතුමා ය.
   (2) ජවහල්ලාල් නේරු තුමා ය.
   (3) කුමාරස්වාමි පඬිවරයා ය.
   (4) රාධා ක්‍රිෂ්ණන් පඬිතුමා ය.

38. කථාවත්ථුප්පකරණය ඇතුළත් කර අභිධර්ම පිටකය සම්පූර්ණ කිරීම,
   (4) තෙවන සංගායනාවේ ප්‍රතිඵලයකි.
   (2) පළමු සංගායනාවේ ප්‍රතිඵලයකි.
   (3) දෙවන සංගායනාවේ ප්‍රතිඵලයකි.
   (4) සිව්වන සංගායනාවේ ප්‍රතිඵලයකි.

39. තමන් උපමාවට ගෙන අනුන් ගැන සිතන්නට පුරුදු පුහුණු කිරීම,
   (1) අත්තූපනායික ධර්ම පර්යාය යි.
   (2) සිව් බඹ විහරණ යි.
   (3) අර්ථ චර්යාව යි.
   (4) අපරිහානිය ධර්ම යි.

40. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාගේ කායික සංවරය සඳහා ආචාර ධර්ම සමූහයක් අනුදැන වදාරා ඇත. මෙම ධර්මතා,
   (1) දස සංයෝජන ධර්ම නමින් හැඳින්වේ.
   (2) ආර්ය මාර්ගය නමින් හැඳින්වේ.
   (3) පාරමිතා ධර්ම නමින් හැඳින්වේ.
   (4) සේඛියා ධර්ම නමින් හැඳින්වේ.

★★

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION - NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- **බුද්ධ ධර්මය - II**

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය :

- **පළමු ප්‍රශ්නය සහ තව ප්‍රශ්න හතරක් ඇතුළුවන සේ ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න .**
- **මෙම ප්‍රශ්න පත්‍රයේ පළමු ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, අනෙකුත් ප්‍රශ්නවලට ලකුණු 10 බැගින්ද වශයෙන් ලකුණු 60 ක් හිමි වේ.**

01.

I. සුද්ධෝදන මහරජතුමා විසින් සිදුහත් කුමරුගේ සැපත වෙනුවෙන් ඉදිකළ මාලිගා තුනෙන් දෙකක් ලියන්න.
II. ඉමස්මිං සති ඉදං හෝති - ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති මෙම ගාථා දෙපදයේ අර්ථය ලියන්න.
III. බුද්ධ ප්‍රතිමාවන් ප්‍රධාන වශයෙන් තුන් ආකාරයකට බෙදා දැක්විය හැකිය. ඉන් දෙකක් නම් කරන්න.
IV. කුරුණෑගල සාහිත්‍ය යුගයේ රචිත පෙරුම් පුරන බෝසතුන් ගේ පෙර ආත්ම භාවයන් හා ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ අතීත කතා දැක්වෙන ග්‍රන්ථ දෙකෙහි නම් ලියන්න.
V. ශ්‍රද්ධාවේ මූලික ප්‍රභේද දෙක නම් කරන්න.
VI. සිවුබඹ විහරණ ධර්ම පිළිවෙලින් නම් කරන්න.
VII. බුද්ධ දේශනාවට අනුව මිනිසුන්ට වැළදෙන රෝග දෙයාකාරයකි. ඒ මොනවාද?
VIII. චේතනාහං භික්ඛවේ කම්මං වදාමි. මෙම පාඨයෙහි අදහස ලියන්න.
IX. ජේතවනාරාමය හා පූර්වාරාමය සාදවා බුදුරජාණන් වහන්සේට පූජා කළ දායකයන් නම් කරන්න.
X. නිවන් සොයන්නෙකු විසින් අත්හළ යුතු අන්ත දෙක මොනවාද?

02.

I. සිගාලෝවාද සූත්‍ර දේශනාවට අනුව යුතුකම් ඉටු කළ යුතු සමාජ කණ්ඩායම් දෙකක් නම් කරන්න.
II. ඉන් එක් සමාජ කණ්ඩායමකින් ඉටුවිය යුතු යුතුකම් තුනක් දක්වන්න.
III. එකිනෙකාට යුතුකම් ඉටු කිරීමෙන් සමාජ සුරක්ෂිතතාවය තහවුරු වන ආකාරය පෙන්වා දෙන්න.

03.

I. නතං කම්මං කතං සාදු යන ධම්මපද ගාථාව සම්පූර්ණ කොට ලියන්න.
II. එම ගාථාවේ තේරුම ද ලියන්න.
III. සමස්ත මානව වර්ගයාට ම එකසේ භාවිතා කළ හැකි වටිනා උපදෙස් ඇතුළත් ග්‍රන්ථයකි. ධම්ම පදය සාකච්ඡා කරන්න.

04.

I. දස රාජධර්ම අතරින් කරුණු දෙකක් නම් කරන්න.
II. ඔබ නම් කරන ලද කරුණු අතරින් එක් කරුණක් කෙටියෙන් විස්තර කරන්න.
III. දස රාජ ධර්මවලට අනුව රට පාලනය කිරීමෙන් පාලකයෙකුට යහපත් පාලනයක් ගෙන යා හැකිය සාකච්ඡා කරන්න.

05.

I. චතුරාර්ය සත්‍ය ධර්මයන් අතුරින් දෙකක් නම් කරන්න.

II. ඉන් එක් අවස්ථාවක් සැකවින් දක්වන්න.

III. එදිනෙදා ජීවිතයේ ගැටලු විසඳාගැනීම සඳහා චතුරාර්ය සත්‍යය උපයෝගි කරගත හැකි ආකාරය සාකච්ඡා කරන්න.

06.

I. දෙවන ධර්ම සංගායනාව සඳහා මූලිකත්වය ගත් මහරහතන් වහන්සේ සහ දායකත්වය ලබාදුන් ලබාදුන් රජුගේ නම ලියන්න.

II. දෙවන ධර්ම සංගායනාව පැවැත්වීම සඳහා ප්‍රධානම හේතුව ලියා දක්වන්න.

III. දෙවන ධර්ම සංගායනාවේ ප්‍රතිඵල බුද්ධ ශාසනයේ චිරස්ථිථිය සඳහා හේතු වූ ආකාරය සාකච්ඡා කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.

I. රේරුකානේ චන්ද්‍රවිමල මහ නාහිමි.

II. සඳකඩ පහණ.

III. මහනුවර යුගයේ චිත්‍ර කලාව.

IV. සප්ත අපරිහානිය ධර්ම.

★★★

**බුද්ධ ධර්මය 1 පිළිතුරු පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 | 1 | 11 | 1 | 21 | 1 | 31 | 4 |
| 2 | 2 | 12 | 3 | 22 | 2 | 32 | 2 |
| 3 | 4 | 13 | 3 | 23 | 4 | 33 | 2 |
| 4 | 3 | 14 | 4 | 24 | 3 | 34 | 3 |
| 5 | 1 | 15 | 1 | 25 | 3 | 35 | 4 |
| 6 | 3 | 16 | 3 | 26 | 2 | 36 | 3 |
| 7 | 4 | 17 | 2 | 27 | 2 | 37 | 1 |
| 8 | 1 | 18 | 1 | 28 | 4 | 38 | 1 |
| 9 | 1 | 19 | 4 | 29 | 2 | 39 | 1 |
| 10 | 2 | 20 | 3 | 30 | 1 | 40 | 4 |

II පත්‍රය

1)
   - I) රම්‍ය, සුරම්‍ය, සුභ.
   - II) මෙය ඇති කල්හි මෙය ඇතිවේ,මෙය හට ගැනීමෙන් මෙය හට ගනී.
   - III) හිටි පිළිම,හිඳි පිළිම,සැතපෙන පිළිම(ඔත් පිළිම)
   - IV) පන්සිය පනස් ජාතක පොත,සිංහල බෝධිවංශය.
   - V) අමූලිකා ශ්‍රද්ධා අකාරවති සද්ධා.
   - VI) මෙත්තා,කරුණා,මුදිතා,උපෙක්ඛා.
   - VII) කායික රෝග,චේතසික රෝග,(මානසික රෝග)
   - VIII)මහණෙනි,මම චේතනාව කර්මය යැයි කියමි.
   - IX) අනේපිඬු සිටුතුමා,විශාඛා සිටුදේවිය.
   - X) අත්තකිලමතානුයෝගය ,කාමසුඛල්ලිකානුයෝගය.

2) 10 ශ්‍රේණිය 09 පාඩම,සබඳතා රකින මිනිස් යුතුකම්.(පිටුව 50)
3) 11 ශ්‍රේණිය 06 දිවි මඟට එළිය දෙන දහම් පද (පිටුව 49)
4) 11 ශ්‍රේණිය 22පාලකයනට මඟ කියන බුදු දහම (පිටුව 156)
5) 10 ශ්‍රේණිය පාඩම 15 සිවුසස් හැඳින සැනසුම ලබමු.(පිටුව 82).
6) 11 ශ්‍රේණිය 16 නිමල දහම රැකුනු අයුරු (පිටුව 108)
7) (I) 11 ශ්‍රේණිය 5 පඩම ආදර්ශවත් චරිත (පිටුව 41).

   (II) 10 ශ්‍රේණිය 20 හෙළ කලාවන් සුරකිමු.(පිටුව 113)

   (III) 11 ශ්‍රේණිය 11හෙළ බොදුකලා (පිටුව132)

   (1v) 10 ශ්‍රේණියරාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම (පිටුව 126)

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**